# මාධ්‍ය නිවේදනය

## ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011-2147401** **ෆැක්ස්: 011-2147412** **2017 ජූලි 03**

රටක ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලබා ගැනීම උදෙසා ශ්‍රම ඉල්ලුමට සරිලන අයුරින් ශ්‍රම බල සැපයුම පැවැතිය යුතු වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වාර්ෂිකව ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය පවත්වමින් ශ්‍රම බල සැපයුම පිළිබඳ සංඛ්‍යාති පිළියෙල කරනු ලැබේ. ශ්‍රම බල ඉල්ලුම පිළිබඳ සංඛ්‍යාති පිළියෙල කිරීම සඳහා ප්‍රථම වරට පෞද්ගලික හා අවිධිමත් අංශයේ ශ්‍රම බල ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයක් මෙම වසරේ ජූලි මාසයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා පැවැසීය.

මෙම සමීක්ෂණය සඳහා ආයතන 3500 ක් විධිමත් නියදි තේරීමේ තාක්ෂණික ක්‍රම වේදයන්ට අනුව තෝරාගෙන ඇත. එසේ තෝරාගෙන ඇති ආයතන වෙත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විස්තරාත්මක දත්ත රැස් කිරීමට පැමිණෙනු ඇත. මෙම සමීක්ෂණයේ දී ශ්‍රම බල ඉල්ලුමට අදාළව වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධව තොරතුරු රැස්කරනු ලබන අතර ඒ යටතේ වැඩි වශයෙන් පුරප්පාඩු පවතින්නේ කවර රැකියා වල ද? ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මොනවා ද? එම සුදුසුකම් සපුරාලීමට දැනට පවතින රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපන ආයතන වල දායකත්වය කෙබඳු ද? අනාගත අපේක්ෂිත බඳවා ගැනීම් පිළිබඳ පුරෝකථන, එක් එක් රැකියා කාණ්ඩ යටතේ දැනට පවතින වැටුප් පරිමා ආදිය පිළිබඳව තොරතුරු රැස් කිරීමට නියමිතය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් මෙම තොරතුරු රැස් කරනු ලබන්නේ සංඛ්‍යාලේඛන ආඥා පනතේ විධිවිධාන වලට අනුව වන අතර සමීක්ෂණය සඳහා තේරී ඇති ආයතන විසින් ලබා දෙනු ලබන තොරතුරු වල රහස්‍යභාවය මුළුමනින්ම ආරක්ෂා කරනු ලැබේ. තව ද මෙම තොරතුරු සංඛ්‍යාති පිළියෙල කිරීමට පමණක් භාවිත කරනු ලබන අතර කිසිම හේතුවක් නිසා වත් මෙලෙස සපයනු ලබන තොරතුරු වෙනත් කිසිම පුද්ගලයකුට හෝ පාර්ශවයකට ලබා නොදෙන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩි දුරටත් පැවැසීය.

එබැවින් රටේ ශීඝ්‍ර සංවර්ධනය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන මෙම තොරතුරු සමීක්ෂණය සඳහා තේරී ඇති ආයතන වෙත ජූලි මාසය තුළ පැමිණෙන දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත කඩිනමින් ලබා දී මෙම සමීක්ෂණය සාර්ථක කර ගැනීමටත්, එමඟින් නිවැරදි සැළසුම් කරණයට දායක වන ලෙසත්, අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙම සමීක්ෂණය සඳහා තේරී ඇති සියලුම ආයතන වලින් / ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටී.

ආචාර්ය ඒ.ජේ.සතරසිංහ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්